# මාධ්‍ය නිවේදනය

## ''ශක්තිමත් සහ ආරක්ෂිත රක්ෂණ අනාගතයකට පිවිසීම''

**ජාතික රක්ෂණ දිනය සහ රක්ෂණ දැනුවත් කිරීමේ මාසය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පණිවිඩය.**

සැප්තැම්බර් පළමුවනදා සහ සැප්තැම්බර් මාසය ශ්‍රී ලංකාවේ ''ජාතික රක්ෂණ දිනය'' සහ ''රක්ෂණ දැනුවත් කිරීමේ මාසය'' ලෙස සමරනු ලබයි. රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මහජනතාව සම්බන්ධතාවය වැඩිකරගැනීම, රක්ෂණයේ වැදගත්කම ඉස්මතු කිරීම සහ රක්ෂණයේ ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති විවිධ ක්‍රියාකාරකම්වල ආරම්භය ජාතික රක්ෂණ දිනයත් සමඟ සනිටුහන් කරනු ඇත.

රක්ෂණ කර්මාන්තයේ නියාමකයා ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) රක්ෂණ ඔප්පුහිමියන් සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන් ආරක්ෂා කිරීමට, ශක්තිමත් අධීක්ෂණ සහ නියාමන රාමුවක් පෝෂණය කිරීමට සහ තිරසාර රක්ෂණ කර්මාන්තයක් ගොඩනැගීම උදෙසා කැපවී සිටී. සුරක්ෂිත සහ ඉදිරි දැක්මක් සහිත ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේදී රක්ෂණය මගින් ඉටු කරන වැදගත් කාර්යභාරය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන තිබෙන අතර පුද්ගලයන්ට, පවුල්වලට සහ ව්‍යාපාරවලට යථා තත්ත්වයට පත් වීමට, නැවත ගොඩනැගීමට සහ විශ්වාසයෙන් ඉදිරියට යාමට බලය ලබා දෙන ආරක්ෂිත ජාලයක් රක්ෂණය විසින් නිර්මාණය කරයි.

රක්ෂණ කර්මාන්තය ආරක්ෂිත සහ වෘත්තීය ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන බව සහතික කරමින්, මග පෙන්වීම, නියාමනය සහ අධීක්ෂණය ලබා දීමෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සේවා සපයන්නන්ට සාර්ථකත්වයේ මාවත විවරකරයි. සියලුම ශ්‍රී ලාංකිකයින්ට ප්‍රවේශ විය හැකි සහ තේරුම් ගත හැකවන අයුරින් රක්ෂණ දැනුම වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම මගින් රක්ෂණ ක්ෂේත්‍රය පුළුල් කිරීම සහ රක්ෂණ අවශ්‍යතා සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය දැනුමෙන් සෑම පුද්ගලයෙක්ම සහ ව්‍යාපාරයක්ම සවිබල ගැන්වීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කැපවී සිටී.

2025 වර්ෂයේදී අපගේ අවධානය යොමු වී ඇත්තේ රක්ෂණ කර්මාන්තයට අදාළ ප්‍රමිතීන් ශක්තිමත් කිරීම, පාරිභෝගික විශ්වාසය වැඩි කිරීම සහ සමාජයේ සියලුම කොටස් හරහා රක්ෂණ ප්‍රවේශය පුළුල් කිරීම කෙරෙහි ය. මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා, ආරක්ෂාව සහ පෙර සූදානමේ වටිනාකම ජනතාව වඩා හොඳින් අවබෝධ කර ගැනීම සහතික කිරීම සඳහා ප්‍රධාන මුලපිරීම් කිහිපයක් දියත් කරන ලදී.

"සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන තේමාව යටතේ සමාජයේ බිම් මට්ටමේ පුරවැසියන් සඳහා ප්‍රමුඛතාවය දෙමින් මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ වැඩසටහන් පැවැත්වීම ආරම්භ කළ අතර එමගින් රක්ෂණයේ වැදගත්කම ප්‍රජාවන් අතරට ගෙනයාමට හැකි විය. ශ්‍රී ලංකා රක්ෂණ කරුවන්ගේ සංගමය(IASL), ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය(SLIBA) සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII), සමඟ සහයෝගයෙන් සහ ලියාපදිංචි ජීවිත හා සාමාන්‍ය රක්ෂණ සමාගම් 29 ක සහභාගීත්වයෙන්, ජූනි මස මාතර දී මහා පරිමාණ දැනුවත් කිරීමේ වැඩමුළුවක්, මාර්ග දැක්මක් සහ මාර්ග ආරක්ෂාව සහ රක්ෂණ වැඩසටහනක් සාර්ථකව පැවැත්වුවෙමු. මෙහි දෙවන වැඩසටහන ඔක්තෝබර් මස යාපනයේදී පැවැත්වීමට නියමිතය.

ශක්තිමත්, අනුවර්තනය විය හැකි සහ විශ්වාසදායක රක්ෂණ අංශයක් ගොඩනැගීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අඛණ්ඩව අවධානය යොමු කරයි. ඉදිරියට එන ප්‍රධාන මුලපිරීම් අතරට මධ්‍යගත මෝටර් රථ රක්ෂණ දත්ත සමුදායක් (Centralized Motor Insurance Database) ස්ථාපිත කිරීම, 5 ශ්‍රේණියේ සිට පාසල් විෂය මාලාවට රක්ෂණ සහ මූල්‍ය සාක්ෂරතාවය ඒකාබද්ධ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීම, සමාජයේ සියලුම කොටස් ආවරණය වන පරිදි රක්ෂණ ව්‍යාප්තිය වැඩි කිරීම සහ සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා දැරිය හැකි මිලට, ප්‍රමිතිගත රක්ෂණ නිෂ්පාදන හඳුන්වා දීම ද ඇතුළත් වේ.

තවද, රක්ෂණ ක්ෂේත්‍රය සඳහා අනාගත නායකයින් බිහි කිරීම අරමුණු කොටගෙන අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක තරඟාවලියක් සංවිධානය කරනු ලබන අතර ඒ සමඟම මූල්‍ය ආරක්ෂාව පිළිබඳ තරුණ ප්‍රජාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම ද සිදු කෙරේ.

මෙම වසරේදී පුළුල් විෂය පථයක් සහිත විද්‍යුත් පුවත් පත්‍රිකාවක් නිර්මාණයකර බෙදා හැරීමට බලාපොරොත්තු වන අතර, එකී පුවත් පත්‍රිකාව මඟින් රක්ෂණ කර්මාන්තයේ නව ප්‍රවණතා, නියාමන යාවත්කාලීන කිරීම් සහ කර්මාන්ත මූලපිරීම් පිළිබඳව කොටස්කරුවන්, වෘත්තිකයන් සහ මහජනතාව දැනුවත් කිරීම, රක්ෂණ අංශය පුරා සන්නිවේදනය සහ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණයි.

දැනුවත් බවින් යුතුව රක්ෂණ ඔප්පු මිලදී ගැනීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය සහ රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කර ගැනීම සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන දැනුවත් කිරිමේ වැඩසටහන්වලට සහභාගී වන මෙන් සියලුම ශ්‍රී ලාංකිකයින්ට ආරාධනා කරයි.

වැඩිදුර තොරතුරු ,යාවත්කාලීන කිරීම් සහ ඉදිරි සිදුවීම් දැනගැනීම සඳහා, කරුණාකර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ IRCSL වෙබ් අඩවියට පිවිස සමාජ මාධ්‍ය නාලිකා වෙත පිවිසෙන්න.

https://www.facebook.com/Ircslofficialpage

https://www.linkedin.com/company/78460854/admin/page-posts/published/

https://www.youtube.com/@ircsl6502/videos

https://ircsl.gov.lk/


**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව,**
11 වන මහල,
නැගෙනහිර කුළුන,
කොළඹ 01

| | |
|---|---|
| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊමේල්: info@ircsl.gov.lk |
| දුරකථන: 011 2396184 - 9 | ෆැක්ස් 011 2396190 |


**03.09.2025**